ඔබේ අංකය
உமது இல
Your No.

අපේ අංකය
எமது இல.
Our No.

දිනය
திகதி
Date

2022 ඔක්තෝබර් 26

ප්‍රවෘත්ති නිවේදනය

සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද විදුලි බිල්පත් වලට බලපාන ආකාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් පැහැදිලි කිරීමක් නිකුත් කර තිබේ. සමාජ ආරක්ෂණ බදු පනතට අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි සැපයුම සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට යටත් වේ. ඒ අනුව ලංකා විදුලි බල මණ්ඩලයෙන් විදුලිය ලබාගන්නා පාර්ශ්වයන්ගේ විදුලිය මිලදී ගැනීම  මත එම බද්ද 2022 ඔක්තෝබර් මස 01 වැනිදා සිට අයකිරීමට ලංකා විදුලි බල මණ්ඩලය කටයුතු කරනු ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපති ජනක රත්නායක මහතා.

“විදුලි පාරිභෝගිකයින් ඇතුළු විදුලි බල කර්මාන්තයේ විවිධ පාර්ශ්වයන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද විදුලිබල කර්මාන්තයට බලපාන ආකාරය පිළිබද විමසීම් කර තිබෙනවා. මෑතකදී විදුලි ගාස්තු සංශෝධනය කල නිසා විදුලි පරිභෝජනය මෙම බද්දෙන් නිදහස් කරන ලෙස අපි මුදල් අමාත්‍යාංශයට යෝජනා කළා. මුදල් අමාත්‍යාංශය අප වෙත දන්වා ඇත්තේ අදාල පනතට අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි සැපයුම මේ බද්දට යටත් වන බවයි. ඒ අනුව 2022 ඔක්තෝබර් 01 දින සිට ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිය මිලදී ගන්නා සියළු පාර්ශ්වයන්ගේ විදුලිය මිලදී ගැනීම මත මේ බද්ද අය කිරීමට ලංවිම පියවර ගනු ඇත.’’

ජනක රත්නායක

සභාපති

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව